Human Rights Commission of Sri Lanka
Library
No. 165, Kynsey Road,
Colombo 08.

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date | 2016-02-24 |
|---|---|---|---|

පැමිණිලිකරු : ආර්.එම් ප්‍රේමතිලක මයා,
38/8, ශ්‍රී ධර්මාරාම පාර,
රත්මලාන.

වගඋත්තරකරුවන් : 01. වී.කේ.ජ් අනුර මයා,
නාගරික කොමසාරිස්,
කොළඹ මහ නගර සභාව,
පුරහල, කොළඹ 07.

02. එච්.ඩී.සී ජානකී මිය,
නාගරික ලේකම්,
කොළඹ මහ නගර සභාව,
පුරහල, කොළඹ 07.

03. එච්.පී කල්දේරා මයා,
සහකාර ලේකම්,
කොළඹ මහ නගර සභාව,
පුරහල, කොළඹ 07.

<u>පැමිණිලි අංකය : **HRC/2146/15**</u>

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2013.03.12 වන විට තමා දිසා කාර්යාලය, අංක 03, කොළඹ නගර සභාවේ ටයර් අංශයේ කම්කරුවකු වශයෙන් සේවය කළ බවත්, එදින ටයර් වැද්දුම්කරු වන බී.එල් හේමන්ත යන අය විසින් OOS 1408 ජේසීබී එකට ටයර් 04 ක් සවිකිරීමට භාරගෙන ආයතනයේ ආරක්ෂක අංශයේද සටහන් යොදා රැගෙන ගොස් ඇති බවත්, පසුව මෙම ටයර් අදාළ වාහනයට සවි නොකිරීම හේතුකොටගෙන එම ටයර් 02 ක් වංචා සහගත ලෙස විකුණා ඇති බවට තොරතුරු ලැබී ඇති බවත්, ඒ සම්බන්ධයෙන් තමාගේ කිසිදු සම්බන්ධතාවයක් නොමැති බවත්ය. තමා ටයර් අංශයේ



| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 165, කින්සි පාර, කොළඹ - 08.<br>165, கின்சி வீதி, கொழும்பு - 08.<br>165, Kynsey Road, Colombo - 08. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 011-2696470 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2696470 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrc@sltnet.lk |
|---|---|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94 - 11 - 2694925, 2685980, 2685981 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2689558 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 011-2689558, 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

සේවය කිරීම සහ අංශ භාර (වැඩ මූලික) සුමනසිංහ මහතාගේ උපදෙස් මත මෙම ටයර් නිකුත් කිරීම සම්බන්ධයෙන් ඉල්ලුම් කිරීමේ පෝරමයේ ටයර් ප්‍රමාණය තමා විසින් සටහන් කර ඇත්තේ ඉහත නිලධාරියාගේ උපදෙස් මත බවත්, එම ටයර් නිකුත් කිරීම සම්බන්ධයෙන් තමා සටහන් යෙදීම පමණක් සිදුකළ බවත් ප්‍රකාශ කර ඇත.

එමෙන්ම මෙම සිද්ධිය සම්බන්ධයෙන් නගර සභාව විසින් මරදාන පොලිස් ස්ථානයට පැමිණිලි කිරීමෙන් පසු පැමිණිලිකරු සහ තවත් 4 දෙනකු 2013.04.30 වන දින අත්අඩංගුවට ගෙන මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාරගත කළ බවත්, අනතුරුව නැවත සේවයට වාර්තා කිරීමට තමාට ඉඩ නොදුන් බවත් ඒ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේ HRC/1691/13 යටතේ පැමිණිල්ලක් කිරීමෙන් පසු ප්‍රධාන කාර්යාලය වෙත තමාට ස්ථාන මාරුවීමක් ලබා දුන් බවත් එතැනින් සති 2 කට පසු අවසාන වශයෙන් සේවය කළ දිසා අංක 03 කාර්යාලය වෙත මාරු කළ බවත් සඳහන් කර ඇත. ඉන්පසු සිද්ධියට අදාළව තමාට චෝදනා පත්‍රයක් ඉදිරිපත් කළ අතර, 2015.06.09 වන දින තමාගේ සේවය අත්හිටවූ බවත් සඳහන් කර ඇත. එතැන් සිට නැවත සේවයට කැඳවා නොමැති බවත්, 2013 වසරේ සිදු වූ සිද්ධියක් සම්බන්ධයෙන් වසර 2 කට පසුව මෙසේ වැඩ තහනමකට ලක්කර නැවත චෝදනා ඉදිරිපත් කිරීම තුළින් පැමිණිලිකරුට අසාධාරණයක් සිදුවී ඇති බවත්, තමාට විරුද්ධව යම්කිසි චෝදනාවක් පවතින්නේ නම් ඒ සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමට තමාට හැකියාවක් ඇති බවත් සඳහන් කර ඇති අතර, තමා සේවයේ පිහිටුවා එම විනය පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර දෙන ලෙසට පැමිණිලිකරු විසින් ඉල්ලා සිට ඇත.

මෙම පැමිණිලිකරුගේ වැඩ තහනම් වීමට අදාළ සිද්ධිය සම්බන්ධයෙන් මීට පෙර අවස්ථාවකදී පැමිණිලිකරු ස්ථාන මාරුකර ඊට සම්බන්ධ අනෙකුත් සේවකයන් 3 දෙනකුගේ වැඩ තහනම් කොට ඇති අතර, එම සිදුවීම 2013 වර්ෂයේදී සිදුවී ඇති බවට ප්‍රකාශ කර ඇත. ඒ අනුව මෙම පැමිණිලිකරුට මුල් අවස්ථාවේදී මෙම සිද්ධියට අදාළ ස්ථාන මාරුවීමක් ලබා දී ඇති බැවින් හා මෙම සිද්ධියට අදාළ අනෙකුත් සේවකයන් සේවයේ යෙදී සිටින බැවින් තමාද නැවත සේවයේ පිහිටුවා විනය පරීක්ෂණය පවත්වා ඒ සම්බන්ධයේ තීරණයක් ගන්නා ලෙසට පැමිණිලි පාර්ශවය විසින් ඉල්ලා සිට ඇත.

තවදුරටත් පැමිණිලි පාර්ශවය ප්‍රකාශ කර ඇත්තේ, තමාගේ වැඩ තහනම් කිරීම අසාධාරණ බවත්, මෙම සිද්ධිය සම්බන්ධයෙන් දඬුවම් දෙකක් තමා වෙත ලබාදීම ආයතනය විසින් සිදුකර ඇති වරදක් බැවින් නැවත සේවයේ පිහිටුවා වැඩ තහනම් කර ඇති කාලය වෙනුවෙන් වැටුප් ලබා ගැනීමට හිමිකමක් ඇති බැවින් වැඩතහනමකට ලක් කළ කාලය වෙනුවෙන් වැටුප් ගෙවීමට කටයුතු කරන ලෙසයි.

**වගඋත්තරකරුවන්ගේ ලිඛිත කරුණු දැක්වීම :-**

වගඋත්තර පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති 2015.07.24 දිනැති ලිඛිත වාර්තාව මගින් පහත කරුණු ඉදිරිපත් කර ඇත.

කොළඹ මහ නගර සභාවේ නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවට අයත් OOS-1408 දරණ බැකෝ යන්ත්‍රයට සවි කිරීමට ලබාගත් ටයර් දෙකක් හා ටියුබ් දෙකක් අස්ථානගත වීම සම්බන්ධයෙන් සිදුකරන ලද මූලික විමර්ශනයේදී අනාවරණය වූ කරුණු අනුව ආර්.එම් ප්‍රේමතිලක මහතාට එම සොරකම සම්බන්ධයෙන් සෘජුවම චෝදනා එල්ල වී ඇති බවත්, මෙම ටයර් අස්ථානගතවීම සම්බන්ධයෙන් පොලිස් ස්ථානයට සිදුකර ඇති පැමිණිල්ල අනුව එම අයව අත්අඩංගුවට ගෙන නඩු අංක බී 97169/13 යටතේ මාලිගාකන්ද මහේස්ත්‍රාත්වරයා විසින් රිමාන්ඩ් බන්ධනාගාරගත කර නඩු පවරා ඇති බවත් සඳහන් කර ඇත.

මූලික විමර්ශන වාර්තාවේ නිර්දේශ සහ රිමාන්ඩ් බන්ධනාගාරගත වීම හේතුවෙන් ආර්.එම් ප්‍රේමතිලක මහතාගේ රාජකාරි වැඩ නාගරික කොමසාරිස්වරයාගේ 2015.06.09 දිනැති ලිපිය මගින් තහනම් කරන ලද බවත්, පැමිණිලිකරු ඇතුළු චූදිත සේවක මහතුන් වෙත චෝදනා පත්‍ර නිකුත් කර ඇති අතර, අදාළ විනය පරීක්ෂණ කඩිමින් අවසන් කර පරීක්ෂණ වාර්තා ලබා දීමට විනය පරීක්ෂණ නිලධාරියෙකු වෙත භාර දී ඇති බවත්, අදාළ විනය පරීක්ෂණ වාර්තාව ලද පසු ආර්.එම් ප්‍රේමතිලක මහතා සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරන බවත් දන්වා ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැවැති පරීක්ෂණයේදී වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කර ඇති කරුණු :-**

මේ සම්බන්ධයෙන් සහකාර ලේකම් එස්. මඩවලගේ මහතා ප්‍රකාශ කර ඇත්තේ, තමා නාගරික කොමසාරිස් වෙත නිර්දේශයක් ඉදිරිපත් කරමින් මෙම සේවකයා නැවත සේවයේ පිහිටුවා විනය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන ලෙස ඉල්ලීමක් කර ඇතත්, නාගරික කොමසාරිස්වරයා එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති බවයි. මෙම පැමිණිලිකරුගේ හැසිරීම ඉතාම අයහපත් බව ඔහුගේ ක්‍රියාවලින් හෙළිවී ඇති බවත්, පරිපාලනය අපහසුතාවයට පත් කරමින් දේශපාලන අධිකාරිය වෙත හා වෙනත් රජයේ ආයතනවලට පෙත්සම් ඉදිරිපත් කිරීම හා පරිපාලන කටයුතු අක්‍රමිකතා ඇති බවට පෙත්සම් ඉදිරිපත් කිරීම අදාළ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හේතු ලෙස ඉදිරිපත් කර ඇති බවද සඳහන් කර ඇත.

ඒ අනුව මෙම පැමිණිලිකරු මෙම සිද්ධියට අදාළව මීට පෙර අවස්ථාවක ස්ථාන මාරුවීමක් සිදුකර ඇති බැවින් හා එම සිද්ධියටම 2013 වසරේදී වැඩතහනම් කරන ලද අනෙකුත් නිලධාරීන් නැවත සේවයේ පිහිටුවා ඔවුන් දැනට සේවය කරමින් සිටියදී චෝදනා පත්‍ර විභාග කිරීම සිදුවන බැවින්

මෙම පැමිණිලිකරුට එම තත්වය අදාළ කරගනිමින් චෝදනා පත්‍රය විභාග කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව හමුවේ සමථයක් ඇති කර ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් වගඋත්තර පාර්ශවය වෙතින් විමසා ඇත. එහිදී මේ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවෙන් නිර්දේශයක් ලබා දෙන්නේ නම් එම නිර්දේශය අනුව කටයුතු කිරීමට හැකියාවක් බවට වගඋත්තර පාර්ශවශවය විසින් ප්‍රකාශ කර ඇත.

තවද මෙම සේවකයා නැවත සේවයේ පිහිටුවීමෙන් පසු ඔහු සේවයේ නොමැති කාලය සඳහා වැටුප් ගෙවීම සම්බන්ධයෙන් නැවත ප්‍රශ්නයක් මතුවිය හැකි බැවින් මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ ලබා දෙන අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කර සේවයේ නොසිටි කාලය වෙනුවෙන් වැටුප් ගෙවීමට අදාළ නිර්දේශයේ කරුණු ඇතුළත් කරන ලෙසට වගඋත්තරකරුවන් විසින් තවදුරටත් ඉල්ලා සිට ඇත.

නිරීක්ෂණ :-

1. මෙම පැමිණිලිකරු කොළඹ මහනගර සභාවේ දිසා කාර්යාලය අංක 3 හි කාර්යාල කාර්ය සහයකයෙකු ලෙස සේවය කරමින් සිටි අයෙකු වන අතර, 2013.03.12 දින වන විට මොහු නගර සභාවේ ටයර් අංශයේ කම්කරුවෙකු ලෙස සේවයේ යෙදී සිටියදී ටයර් 2 ක් වංචා සහගත ලෙස විකිණීම සම්බන්ධයෙන් තවත් සේවකයන් 4 දෙනකු සමඟ අදාළ චෝදනාවට ලක්වී ඇති බව නිරීක්ෂණය වේ.

2. එම කාරණය හේතුකොටගෙන මෙම පැමිණිලිකරුට සහ තවත් සේවකයන් 4 දෙනකුට විරුද්ධව මරදාන පොලිස් ස්ථානයේ පැමිණිලි කිරීමෙන් පසු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාරගත වී ඇප මත නිදහස් වී ඇති බවද නිරීක්ෂණය වේ.

3. පැමිණිලිකරු බන්ධනාගාරයෙන් නිදහස් වීමෙන් පසු සේවයට වාර්තා කිරීමට ඉඩ නොදීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවට නැවත පැමිණිලි කිරීම මත සේවයට වාර්තා කිරීමට ඉඩ ලැබුනු බවත්, ඉන් පසු ඉහත කාරණය හේතුකොටගෙන තමා ස්ථාන මාරුකර ඇති බවත් ප්‍රකාශ කොට ඇත.

4. මුල් අවස්ථාවේදී මෙම සිද්ධියට සෘජුවම වගකිවයුතු අයගේ සේවය අත්හිටුවා ඇති බවත්, පසුව ඔවුන් නැවත සේවයේ පිහිටුවා ඇති බවත්, පාර්ශවයන්ගේ කරුණු ඉදිරිපත් කිරීම අනුව නිරීක්ෂණය වී ඇත.

5. ඉහත සිද්ධීන් හේතුකොටගෙන නැවත 2015 වසරේදී මෙම පැමිණිලිකරුගේ සහ තවත් එක් අයකුගේ සේවය අත්හිටුවා ඇති නමුත් මෙම සිද්ධිය සම්බන්ධයෙන් අනෙක් සේවකයන් දැනට <u>සේවයේ යෙදී සිටියදී</u> ඔවුන්ට චෝදනා පත්‍රය ලබා දී ඇති බවද නිරීක්ෂණය වී ඇත.

6. පැමිණිලිකරු 2013 වසරේ ස්ථාන මාරු කර ඇත්තේ, මෙම කාරණය හේතුකොටගෙන වන අතර, 2015 වසරේ පැමිණිලිකරුගේ සේවය අත්හිටුවා ඇති අතර, මෙය එකම සිදුවීමකට අවස්ථා දෙකකදී දඬුවම් කිරීමක් වන බවට පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

7. වගඋත්තරකරුවන් මෙම පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවා විනය පරීක්ෂණ කටයුතු සිදු නොකිරීමට හේතු ලෙස ඉදිරිපත් කර ඇත්තේ, මෙම පැමිණිලිකරු පරිපාලනයට විරුද්ධව පෙත්සම් ඉදිරිපත් කරන බැවින් නැවත සේවයේ පිහිටුවිය නොහැකි බවට වන බවද නිරීක්ෂණය වේ.

8. මේ අනුව එකම සිද්ධියක් සම්බන්ධයෙන් චෝදනා ලබා සිටින පුද්ගලයින් කිහිප දෙනකු සේවයේ යෙදී සිටියදී විනය පරීක්ෂණය සිදු කිරීමත්, පැමිණිලිකරුගේ සහ තවත් අයකුගේ පමණක් සේවය අත්හිටුවා විනය පරීක්ෂණය සිදුකිරීමත් සමාන කොටස් අතර අසමාන සැළකීමක් වන බව නිරීක්ෂණය වේ.

9. පැමිණිලිකරු පරිපාලනයට විරුද්ධව පෙත්සම් ඉදිරිපත් කර ඇතැයි විශ්වාසය මත සේවයේ නොපිහිටුවීම පැමිණිලිකරුට සිදු කරන වෙනස්කමක් ලෙස පෙනී යන අතර, එවැනි කාරණා තිබේනම් පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු තීරණයකට එළඹීමට ආයතන පරීක්ෂණයට හැකියාවක් ඇති බවද කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

නිගමනය :-

ඉහත කරුණු සලකා බැලීමේදී පැමිණිලිකරු සිදුකරන ලද අක්‍රමිකතාවයන් හේතුකොටගෙන 2013 වසරේදී ස්ථානමාරුවීම් කර චෝදනා පත්‍රයක් ලබා දී විනය පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කර තිබියදී නැවත 2015 වසරේ සිද්ධියෙන් වසර 02 කට පසු පැමිණිලිකරුගේ සේවය අත්හිටුවීම ගැටළු සහගත තත්වයක් වන බවට කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

එමෙන්ම මෙම සිද්ධියට සම්බන්ධ චෝදනා ලබා ඇති අනෙකුත් සේවකයන් සේවයේ සිටියදී චෝදනා පත්‍රය විභාග කිරීමටත්, මෙම පැමිණිලිකරුගේ සේවය අත්හිටුවා චෝදනා පත්‍ර විභාග කිරීමටත් පිළිගත හැකි සාධාරණ හේතු ඉදිරිපත් කිරීමට වගඋත්තරකරුවන් අපොහොසත් වී ඇත. ඒ අනුව එම ක්‍රියාව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව අනුව නීතිය ඉදිරියේ අසමාන ලෙස සැළකිලිමත් බවට පරීක්ෂණයෙන් අනතුරුව තීරණය කරනු ලැබේ.

නිර්දේශය ඃ-

ඒ අනුව, මෙම පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවා විනය පරීක්ෂණයේ ඉදිරි කටයුතු සිදු කිරීමටත්, විනය පරීක්ෂණය කඩිනමින් අවසන් කර විනය පරීක්ෂණ තීන්දුව අනුව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටත් මෙයින් වගඋත්තර පාර්ශවය වෙත නිර්දේශ කරනු ලැබේ.

2016.0[illegible].[illegible] දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

B/

**Dr. N. D. Udagama**
Chairperson
Human Rights Commission of Sri Lanka